සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது)
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 1997 අගෝස්තු (නව නිර්දේශය)
கல்விப் பொதுத் தராதரப்பத்திர(உயர் தர)ப் பரீட்சை, 1997 ஓகஸ்ற் (புதிய பாடத்திட்டம்)
General Certificate of Education (Adv. Level) Examination, August 1997 (New Syllabus)

භෞතික විද්‍යාව I
பௌதிகவியல் I
Physics I

01 | S | I

පැය දෙකයි / இரண்டு மணி / Two hours

වැදගත් : මෙම ප්‍රශ්න පත්‍රය කඩදසි තුනකින් සමන්විත ය.
පිළිතුරු සැපයීමට පෙර ඒවා පිටු අංක අනුව පිළිවෙල කර ගන්න.
ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නො ලැබේ.

සැලකිය යුතුයි :

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) 1 සිට 60 දක්වා වූ එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.

(iii) උත්තර පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය සඳහා ඇති කොටුවලින් ඔබ තෝරා ගත් උත්තරයේ, අංකයට සැසැඳෙන කොටුව තුළ (X) ලකුණ පැහැදිලිව යොදන්න.

(iv) උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද පරෙස්සමෙන් කියවන්න.

$(g = 10\ N\ kg^{-1})$

1. පහත දක්වා ඇති ඒවායින් කුමක් ගම්‍යතාවේ ඒකකය වේ ද?

(1) $N\ s^{-2}$ (2) $N\ s^{-1}$ (3) $N\ s$ (4) $N\ s^{2}$ (5) $N^{2}s$

2. ධ්වනියේ ගුණය රඳා පවතින්නේ එහි

(1) සංඛ්‍යාතය මත ය.
(2) විස්තාරය මත ය.
(3) තරංග ආයාමය මත ය.
(4) හඬේ සැර මත ය
(5) උපරිතාන පැවතීම මත ය.

3. ඇදී තන්තුවක් තුළ තිර්යක් තරංගවල ප්‍රවේගය රඳා පවතිනුයේ

(1) කම්පනයේ සංඛ්‍යාතය මත ය.
(2) තරංගයේ තරංග ආයාමය මත ය.
(3) තරංගයේ විස්තාරය මත ය.
(4) තන්තුවෙහි ආතතිය මත ය.
(5) තන්තුවේ දිග මත ය.

4. ප්‍රභවයකින් නිකුත් වන ධ්වනි තීව්‍රතාව එහි මුල් අගය මෙන් 10^{6} ගුණයක් වැඩි කරන ලදී. මීට අනුරූපව වැඩි වන ධ්වනි තීව්‍රතා මට්ටම dB වලින්

(1) 5 (2) 6 (3) 50 (4) 60 (5) 600

5. උත්තල කාචයක නාභි දුර 5 cm වේ. එම කාචයෙහි බලයේ විශාලත්වය ඩයොප්ටරවලින්

(1) 0·025 (2) 0·2 (3) 5 (4) 10 (5) 20

6. $X-$ කිරණ පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරින් සත්‍ය නොවන්නේ කුමක් ද?

(1) රික්තයේ දී $X-$ කිරණ ආලෝකයේ වේගයෙන් ප්‍රචාරණය වේ.
(2) $X-$ කිරණ ස්ඵටික දැලිසක් මගින් විවර්තනය කළ හැකි ය.
(3) $X-$ කිරණ මගින් ප්‍රකාශ විද්‍යුත් ආචරණය ඇති කළ හැක.
(4) විද්‍යුත් හෝ චුම්බක ක්ෂේත්‍ර මගින් $X-$ කිරණ උත්ක්‍රමය කළ හැක.
(5) $X-$ කිරණ මගින් වායුවක් අයනීකරණය කළ හැකිය.

7. පරිපූර්ණ පරිණාමකයක ප්‍රාථමික එතුමේ (winding) වට සංඛ්‍යාව 200 වන අතර ද්විතීයික එතුමේ වට සංඛ්‍යාව 50 වේ. ද්විතීයිකයේ ගලන ධාරාව 40 A නම් ප්‍රාථමිකයේ ධාරාව වන්නේ

(1) 5 A
(2) 10 A
(3) 80 A
(4) 120 A
(5) 160 A

[අනෙක් පිට බලන්න.

8.



ජල (H_2O) අණුවක හැඩය රූපයෙන් පෙන්වා ඇත. අණුවේ ගුරුත්ව කේන්ද්‍රය පිහිටීමට වඩාත් ම ළඟ ඇති ලක්ෂ්‍යය වනුයේ

(1) P
(2) Q
(3) R
(4) S
(5) T

9. රූපයේ දක්වෙන පරිදි ටැංකියක පතුලේ සිරස් සිහින් නලයක් ඇත. h උසක ජල මට්ටම පවත්වා ගෙන යාම සඳහා ටැංකියට ජලය සැපයිය යුතු නියත ශීඝ්‍රතාව Q වේ. ජල මට්ටමේ උස $2h$ හි පවත්වා ගැනීම සඳහා ජලය සැපයිය යුතු ශීඝ්‍රතාව



(1) Q/2. (2) Q. (3) 2 Q. (4) 3Q. (5) 4Q.

10. කෘෂ්ණ වස්තුවකින් විමෝචනය කරන විකිරණයේ I තීව්‍රතාවය λ තරංග ආයාමය සමග වෙනස් වන ආකාරය රූපයේ දක්වේ. කෘෂ්ණ වස්තුවේ උෂ්ණත්වය වැඩිවන විට උපරිම තීව්‍රතාව,



(1) I_m වැඩි වන අතර එහි පිහිටීම දිගු තරංග ආයාම දෙසට විස්ථාපනය වේ.
(2) I_m වැඩි වන අතර එහි පිහිටීම කෙටි තරංග ආයාම දෙසට විස්ථාපනය වේ.
(3) I_m අඩු වන අතර එහි පිහිටීම දිගු තරංග ආයාම දෙසට විස්ථාපනය වේ.
(4) I_m අඩු වන අතර එහි පිහිටීම කෙටි තරංග ආයාම දෙසට විස්ථාපනය වේ.
(5) I_m නියත ව පවතින අතර එහි පිහිටීම කෙටි තරංග ආයාම දෙසට විස්ථාපනය වේ.

11. ඇසක විශද දෘෂ්ටියේ අවම දුර 1 m වේ. මෙය 25 cm බවට වෙනස් කිරීමට අවශ්‍ය කාචය
(1) නාභිය දුර 25 cm වන උත්තල එකකි. (2) නාභිය දුර 25 cm වන අවතල එකකි.
(3) නාභිය දුර 33·3 cm වන උත්තල එකකි. (4) නාභිය දුර 33·3 cm වන අවතල එකකි.
(5) නාභිය දුර 40 cm වන උත්තල එකකි.

12. සරල අනුවර්තී චලිතයක් සිදු කරන වස්තුවක ත්වරණය (a) සහ එහි සමතුලිතතා පිහිටීමේ සිට විස්ථාපනය (x) අතර ඇති සම්බන්ධතාව ඉතාමත් හොඳින් නිරූපණය කරනු ලබන්නේ පහත සඳහන් කුමන වක්‍රයෙන් ද?



13. වාතයෙන් පුරවා ඇති ඒකලිත සමාන්තර තහඩු ධාරිත්‍රකයක් V විභව අන්තරයකට ආරෝපණය කර ඇත. ඊට පසු තහඩු අතර අවකාශය පාරවිද්‍යුත් නියතය 2 වූ මාධ්‍යයකින් පිරවූ විට එහි විභව අන්තරය වනුයේ

(1) V/2 (2) $\frac{V}{\sqrt{2}}$ (3) V (4) $\sqrt{2}$ V (5) 2 V

14. රූපයේ පෙන්වා ඇති F බලය ලබා ගත හැක්කේ



(1) A හි පමණක් පෙන්වා ඇති F_1 සහ F_2 බල එකතු කිරීම මගිනි.
(2) B හි පමණක් පෙන්වා ඇති F_1 සහ F_2 බල එකතු කිරීම මගිනි.
(3) C හි පමණක් පෙන්වා ඇති F_1 සහ F_2 බල එකතු කිරීම මගිනි.
(4) A සහ B හි පමණක් පෙන්වා ඇති F_1 සහ F_2 බල එකතු කිරීම මගිනි.
(5) A, B සහ C යන සියල්ලෙහි පෙන්වා ඇති F_1 සහ F_2 බල එකතු කිරීම මගිනි.

15. නිසඟ අර්ධ සන්නායකයක් සම්බන්ධයෙන් කර ඇති පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න.

(A) උෂ්ණත්වය වැඩි වන විට, විද්‍යුත් සන්නායකතාව අඩු වේ.
(B) උෂ්ණත්වය වැඩි වන විට නිදහස් ඉලෙක්ට්‍රෝන සංඛ්‍යාවට කුහර සංඛ්‍යාව දරන අනුපාතය නියතව පවතී.
(C) නිදහස් ඉලෙක්ට්‍රෝන සහ කුහර යන දෙවර්ගයම විද්‍යුත් සන්නායකතාවට දායක වේ.

ඉහත ප්‍රකාශ අතුරින්
(1) *A* පමණක් සත්‍ය වේ. (2) *B* පමණක් සත්‍ය වේ. (3) *C* පමණක් සත්‍ය වේ.
(4) *B, C* පමණක් සත්‍ය වේ. (5) *A, B* සහ *C* යන සියල්ල ම සත්‍ය වේ.

16. රූපයේ පෙන්වා ඇති පරිදි සුමට කප්පියක් උඩින් යවන ලද සැහැල්ලු තන්තුවක ස්කන්ධය 1 kg වූ දුනු තරාදියක් සහ 1 kg සහ 2 kg වන ස්කන්ධ දෙකක් දරා සිටී. තරාදියේ පාඨාංකය වනුයේ
(1) ශුන්‍යය ය. (2) 1 kg (3) 2 kg
(4) 3 kg (5) 4 kg



17. ස්කන්ධය 1·4 kg වන ඔටුන්නක් සම්පූර්ණයෙන් ම ජලයේ ගිලී ඇති විට එහි දෘශ්‍ය බර 1·3 kg විය. ඔටුන්න සාද ඇති ද්‍රව්‍යයේ මධ්‍යන්‍ය ඝනත්වය වන්නේ (ජලයේ ඝනත්වය = 10^3 kg m^{-3})
(1) $1{\cdot}1 \times 10^3$ kg m^{-3} (2) $1{\cdot}3 \times 10^3$ kg m^{-3} (3) $1{\cdot}4 \times 10^3$ kg m^{-3}
(4) $1{\cdot}4 \times 10^4$ kg m^{-3} (5) $2{\cdot}7 \times 10^4$ kg m^{-3}

18. තිරස් දිසාවක් ඔස්සේ වම් පසට 10 m s^{-1} ප්‍රවේගයකින් ගමන් කරන 5×10^{-2} kg වූ මැටි ගුලියක්, තිරස් දිසාව ඔස්සේ ම 12 m s^{-1} ප්‍රවේගයකින් දකුණු පසට ගමන් කරන 6×10^{-2} kg වූ මැටි ගුලියක් සමග ගැටේ. ගැටුමෙන් පසු ගුලි දෙක එකට ඇලී පවතී නම් එම සංයුක්ත වස්තුව ගමන් ගන්නා ප්‍රවේගය වන්නේ
(1) 0 (2) 1 m s^{-1} (3) 2 m s^{-1} (4) 11 m s^{-1} (5) 22 m s^{-1}

19. පරිපූර්ණ වායුවක දී ඇති ස්කන්ධයක පරිමාව නියත ව තබා ගනිමින් එහි පීඩනය දෙගුණ කළ විට වායු අණුවක උත්තාරණ චාලක ශක්තියෙහි සාමාන්‍ය අගය
(1) නොවෙනස් ව පවතී. (2) අර්ධයක් බවට පත්වේ.
(3) දෙගුණයක් බවට පත්වේ. (4) තුන් ගුණයක් බවට පත්වේ.
(5) සතර ගුණයක් බවට පත්වේ.

20. මිටියක් රූපයේ පෙන්වා ඇති පරිදි *A, B* සහ *C* ලක්ෂ්‍ය වටා එක ම කෝණික ත්වරණයකින් පද්දනු ලැබේ. අවශ්‍ය වන ව්‍යාවර්ත පිළිවෙලින් Γ_A, Γ_B හා Γ_C නම්
(1) $\Gamma_A > \Gamma_B > \Gamma_C$
(2) $\Gamma_A > \Gamma_C > \Gamma_B$
(3) $\Gamma_C > \Gamma_B > \Gamma_A$
(4) $\Gamma_A = \Gamma_C < \Gamma_B$
(5) $\Gamma_A = \Gamma_B = \Gamma_C$



21. 130 m s^{-1} වේගයකින් ගමන් කරන ඊයම් උණ්ඩයක් ලී කුට්ටියක් තුළ නතර වේ. ඊයම්හි විශිෂ්ට තාප ධාරිතාව 130 J kg^{-1} °C^{-1} වේ. මුළු ශක්ති වෙනස ම උණ්ඩය රත් වීම සඳහා යෙදෙන්නේ නම් උණ්ඩයෙහි උෂ්ණත්වය වැඩි වීම
(1) 45 °C (2) 55 °C (3) 65 °C (4) 75 °C (5) 85 °C

22. ජල පෘෂ්ඨයක් මත දකුණට ගමන් කරන තීර්යක් තරංගයක ක්ෂණික පිහිටුම රූපයේ දක්වේ. A සහ B යනු පාවෙන කුඩා වස්තු දෙකකි. මෙම පිහිටුමේ සිට තරංගය දකුණට ගමන් කරන විට
(1) A සහ B දෙක ම දකුණට ගමන් කිරීම ආරම්භ කරයි.
(2) A සහ B දෙක ම වමට ගමන් කිරීම ආරම්භ කරයි.
(3) A සහ B දෙක ම පහළට ගමන් කිරීම ආරම්භ කරයි.
(4) A ඉහළට ගමන් කිරීම ආරම්භ කරන අතර B පහළට ගමන් කිරීම ආරම්භ කරයි.
(5) A පහළට ගමන් කිරීම ආරම්භ කරන අතර B ඉහළට ගමන් කිරීම ආරම්භ කරයි.



23. පෘථිවි පෘෂ්ඨය මත දී වස්තුවක බර 600 N වේ. පෘථිවි පෘෂ්ඨයට ඉහළින් එක් පෘථිවි අරයක උසක දී වස්තුවේ බර වනුයේ

(1) 150 N (2) 240 N (3) 300 N (4) 600 N (5) 2400 N

24. ස්කන්ධයන් M සහ $2M$ වූ කුඩා වස්තු දෙකක් පොළොව මට්ටමේ සිට පිළිවෙළින් $2h$ සහ h වූ උස මට්ටම්වලින් නිශ්චලතාවේ සිට නිදහස් කරනු ලැබේ. පොළොවට වැදීමට මොහොතකට පෙර ස්කන්ධ දෙක ම සඳහා පහත සඳහන් ඒවායින් කුමක් එක ම අගයක් ගනී ද? (වාත ප්‍රතිරෝධය නොසලකා හරින්න.)

(1) වේගය (2) චාලක ශක්තිය (3) ගමන් කළ කාලය

(4) ස්කන්ධ මත ක්‍රියා කරන ගුරුත්ව බලය (5) ගම්‍යතාව

25. උණ්ඩයක් සිරස්ව 2 m උසක් ප්‍රක්ෂේපණය කිරීම සඳහා සෙල්ලම් තුවක්කුවක දුන්නක් 5 mm ප්‍රමාණයකින් සම්පීඩනය කළ යුතු ය. එම උණ්ඩයම සිරස්ව 8 m උසක් ප්‍රක්ෂේපණය කිරීම සඳහා දුන්න සම්පීඩනය කළ යුතු අවම ප්‍රමාණය වනුයේ

(1) 100 m (2) 80 mm (3) 50 mm (4) 20 mm (5) 10 mm

26. නාභිය දුර 5 cm වන අභිසාරී කාචයක් විශාලක කාචයක් වශයෙන් භාවිත වේ. විශද දෘෂ්ටියේ අවම දුර 25 cm නම්, ලබා ගත හැකි විශාලනයේ උපරිම අගය වනුයේ

(1) 4 (2) 5 (3) 6 (4) 8 (5) 10

27. වාතය තුළ දී ධ්වනි ප්‍රවේගය මෙන් $\frac{1}{4}$ ක ප්‍රවේගයකින් යුතුව ධ්වනි ප්‍රභවයක් නිශ්චල නිරීක්ෂකයෙක් දෙසට චලනය වේ.

$$\frac{\text{නිරීක්ෂකයාට ඇසෙන දෘශ්‍ය සංඛ්‍යාතය}}{\text{ප්‍රභවය නිකුත් කරන සංඛ්‍යාතය}}$$ යන අනුපාතයෙහි අගය වන්නේ

(1) $\frac{1}{4}$ (2) $\frac{1}{2}$ (3) $\frac{3}{4}$ (4) $\frac{4}{3}$ (5) 4

28. පෙන්වා ඇති පරිපථ රූප සටහනේ E යනු, වි.ගා.බ. 12 V සහ අභ්‍යන්තර ප්‍රතිරෝධය 3Ω වන කෝෂයකි. A යනු නොගිණිය හැකි ප්‍රතිරෝධයක් සහිත ඇමීටරයකි. S ස්විච්චිය වැසූ විට A හි පාඨාංකය

(1) 0·5 A
(2) 1 A
(3) 2 A
(4) 4 A
(5) 8 A



29. රූපයේ දක්වෙන පරිදි V ප්‍රවේගය ඇති ආරෝපිත අංශුවක් ප්‍රාව ඝනත්වය B වූ ඒකාකාර චුම්බක ක්ෂේත්‍රයකට ලම්බව ඇතුළු වී අරය R වූ වෘත්තාකාර මාර්ගයක ගමන් කරයි. අංශුව මත ආරෝපණය q නම් අංශුවේ ස්කන්ධය වනුයේ

(1) $\frac{BqR}{V}$ (2) $\frac{Bq}{R}$

(3) $\frac{BqR}{V^2}$ (4) $\frac{BqR^2}{V}$

(5) $\frac{BqV^2}{R}$



30. පෙන්වා ඇති සත්‍ය වගුවට අදාළ වන තාර්කික ද්වාරය වන්නේ

A	B	F
0	0	0
0	1	1
1	0	1
1	1	1



31. රූපයේ දක්වෙන පරිදි පතුලේ වර්ගඵලය A හා උස L වූ භාජනයකට l දිගැති නළයක් සවි කර ඇත. නලයේ අභ්‍යන්තර හරස්කඩ වර්ගඵලය a නම් සහ භාජනය හා නළය, ඝනත්වය ρ වූ ද්‍රවයකින් සම්පූර්ණයෙන් පුරවා ඇත්නම් ද්‍රවය මගින් භාජනයේ පතුළ මත ඇති කරන බලය වනුයේ



(1) $A(L+l)\rho g$
(2) $(A-a)L\rho g + a(L+l)\rho g$
(3) $AL\rho g$
(4) $a(L+l)\rho g$
(5) $(AL+al)\rho g$

32. සිහින් බිත්ති සහිත $4h$ උසකින් යුත් සිලින්ඩරාකාර ලෝහ භාජනයක් තුළ h උසකට ජලය පුරවා ඇත. මෙම සිලින්ඩරය ජලයේ ගිල්වූ විට එය එහි උසින් අර්ධයක් ජල මට්ටමෙන් පහළ පිහිටන සේ රූපයේ පෙන්වා ඇති පරිදි පාවේ. මෙම සිලින්ඩරය එහි සම්පූර්ණ උස ම වාගේ ජල මට්ටමෙන් පහත පිහිටන සේ පාවී තිබීමට නම් සිලින්ඩරය තුළ ජල මට්ටම h උසෙහි සිට



(1) $\frac{4}{3}h$ දක්වා වැඩි කළ යුතු ය.
(2) $2h$ දක්වා වැඩි කළ යුතු ය.
(3) $\frac{8}{3}h$ දක්වා වැඩි කළ යුතු ය.
(4) $3h$ දක්වා වැඩි කළ යුතු ය.
(5) $\frac{7}{2}h$ දක්වා වැඩි කළ යුතු ය.

33. විදුරු - රසදිය උෂ්ණත්වමානයක බල්බයේ පරිමාව $0{\cdot}5\ cm^3$ වන අතර කදෙහි අභ්‍යන්තර හරස්කඩ වර්ගඵලය $4\times10^{-4}\ cm^2$ වේ. උෂ්ණත්වමානයේ $0\ ^\circ C$ හා $100\ ^\circ C$ සලකුණු අතර දුර $20\ cm$ වේ නම් විදුරු තුළ රසදියෙහි දෘශ්‍ය පරිමා ප්‍රසාරණතාව ආසන්න වශයෙන්

(1) $8\times10^{-5}\ ^\circ C^{-1}$
(2) $1{\cdot}6\times10^{-5}\ ^\circ C^{-1}$
(3) $8\times10^{-4}\ ^\circ C^{-1}$
(4) $1{\cdot}6\times10^{-4}\ ^\circ C^{-1}$
(5) $3{\cdot}2\times10^{-5}\ ^\circ C^{-1}$

34. අක්ෂය වටා අවස්ථිති ඝූර්ණය $2\ kg\ m^2$ වූ භ්‍රමණය වන ජව රෝදයකට $20\ Nm$ වන නියත බල යුග්මයක් යෙදීමෙන් $20\ s$ කාලයක් තුළ දී නිශ්චලතාවට ගෙන එන ලදී. ජව රෝදයේ ආරම්භක කෝණික ප්‍රවේගය $rad\ s^{-1}$ වලින්

(1) 50
(2) 100
(3) 200
(4) 400
(5) 800

35. පෙන්වා ඇති රූපවල I මගින් O වස්තුවෙහි ප්‍රතිබිම්බය දක්වා ඇත.
පෙට්ටිය තුළ සෘජුකෝණි සමද්විපාද ප්‍රිස්මයක් තැබීමෙන් රූපවල පෙන්වා ඇති පරිදි ප්‍රතිබිම්බ ලබා ගත හැක්කේ



(A) (B) (C)

(1) B හිදී පමණි.
(2) A සහ C හිදී පමණි.
(3) B සහ C හිදී පමණි.
(4) A සහ B හිදී පමණි.
(5) A, B සහ C යන සැම එකකින්ම ය.

36. 50 cm දිගකින් යුත් ඔර්ගල් නළයක එක් කෙළවරක් වසා ඇත. වාතයේ ධ්වනි වේගය 300 m s^{-1} නම් නළය නාද කළ විට ඉන් ඇති වන පහත් ම අනුනාද සංඛ්‍යාත දෙක වන්නේ

(1) 150 Hz සහ 300 Hz
(2) 150 Hz සහ 450 Hz
(3) 300 Hz සහ 450 Hz
(4) 300 Hz සහ 900 Hz
(5) 450 Hz සහ 1050 Hz

37. නොගිණිය හැකි අභ්‍යන්තර ප්‍රතිරෝධයක් හා වි.ගා.බ. 12 V වන බැටරියක් 1·5 V, 0·50 A බල්බ තුනකට රූපයෙන් පෙන්වා ඇති පරිදි සම්බන්ධ කොට ඇත. බල්බ සාමාන්‍ය දීප්තියෙන් දැල්වීම සඳහා R ප්‍රතිරෝධයට තිබිය යුතු අගය වන්නේ



(1) 5 Ω
(2) 7 Ω
(3) 15 Ω
(4) 21 Ω
(5) 30 Ω

38. රූපයේ පෙන්වා ඇති ප්‍රතිරෝධ ජාලයේ සෑම ප්‍රතිරෝධයකින් ම උත්සර්ජනය කළ හැකි උපරිම ක්ෂමතාව 20 W වේ. ජාලය මගින් උත්සර්ජනය කළ හැකි උපරිම ක්ෂමතාව වනුයේ



(1) 20 W
(2) 30 W
(3) 40 W
(4) 60 W
(5) 80 W

39. නියත උෂ්ණත්ව බරුවක් තුළ ගිල්වා ඇති පරිමාව V සහ $2V$ වන X සහ Y නම් බල්බ දෙකක් තුළ පිළිවෙලින් සාපේක්ෂ අණුක ස්කන්ධය 2 සහ 28 වන පරිපූර්ණ වායු දෙකක් අන්තර්ගත කර ඇත. බල්බ දෙක පටු නළයකින් සම්බන්ධ කර ඇති අතර වායූන් දෙක කුඩා රසදිය බිඳක් (P) මගින් රූපයේ පෙන්වා ඇති පරිදි වෙන්කර තබා ඇත.



$$\frac{X \text{ හි ඇති වායු ස්කන්ධය}}{Y \text{ හි ඇති වායු ස්කන්ධය}}$$ යන අනුපාතයෙහි අගය

(1) $\frac{1}{28}$
(2) $\frac{1}{7}$
(3) 7
(4) 14
(5) 28

40. උණුසුම් ද්‍රවයක උෂ්ණත්වය මැනීම සඳහා වීදුරු - රසදිය උෂ්ණත්වමානයක් සහ තාප විද්‍යුත් යුග්මයක් භාවිත කළ විට, තාප විද්‍යුත් යුග්මය මගින් වැඩි උෂ්ණත්වයක් වාර්තා විය. මේ සඳහා දිය හැකි වඩාත්ම උචිත හේතුව වන්නේ

(1) තාප විද්‍යුත් යුග්මය රසදිය උෂ්ණත්වමානයට වඩා සංවේදී වීම ය.
(2) තාප විද්‍යුත් යුග්මය රසදිය උෂ්ණත්වමානයට වඩා ඉක්මනින් ප්‍රතිචාර දැක්වීම ය.
(3) කියවීමක් වාර්තා කිරීම සඳහා රසදිය උෂ්ණත්වමානය උරා ගන්නවාට වඩා වැඩි තාප ප්‍රමාණයක් තාප විද්‍යුත් යුග්මය උරා ගැනීම ය.
(4) ද්‍රව පරිමාව ඉතා කුඩා වීම ය.
(5) රසදියෙහි විශිෂ්ට තාපධාරිතාව, තාප විද්‍යුත් යුග්මය සාදා ඇති ලෝහවල විශිෂ්ට තාප ධාරිතා අගයන්ට වඩා කුඩා වීම ය.

41. ක්‍රියාවලියකට යටත් වන පරිපූර්ණ වායුවක් පිළිබඳ කර ඇති පහත ප්‍රකාශ සලකා බලන්න.

(A) නියත පරිමා ක්‍රියාවලියක් සඳහා $\Delta Q = \Delta U$ වේ.
(B) සමෝෂ්ණ ක්‍රියාවලියක් සඳහා ΔU සැමවිට ම ශුන්‍ය වේ.
(C) ස්ථිරතාපී සම්පීඩනයක් සඳහා $\Delta U > 0$ වේ.

ඉහත ප්‍රකාශ අතරින්

(1) A පමණක් සත්‍ය වේ.
(2) A සහ B පමණක් සත්‍ය වේ.
(3) B සහ C පමණක් සත්‍ය වේ.
(4) A සහ C පමණක් සත්‍ය වේ.
(5) A, B සහ C යන සියල්ලම සත්‍ය වේ.

42. එක්තරා දිනයක X නගරයේ තුෂාර අංකය Y නගරයේ තුෂාර අංකය මෙන් දෙගුණයකි. නගර දෙක පිළිබඳ කර ඇති පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න.

(A) Y නගරයේ උෂ්ණත්වය X නගරයේ උෂ්ණත්වය මෙන් දෙගුණයක් විය යුතු ය.
(B) X නගරයේ සාපේක්ෂ ආර්ද්‍රතාව, Y නගරයේ සාපේක්ෂ ආර්ද්‍රතාව මෙන් දෙගුණයක් විය යුතු ය.
(C) තුෂාර අංකයේ දී X නගරයේ නිරපේක්ෂ ආර්ද්‍රතාව Y නගරයේ නිරපේක්ෂ ආර්ද්‍රතාවට වඩා වැඩි විය යුතු ය.

ඉහත ප්‍රකාශ අතරින්
(1) A පමණක් සත්‍ය වේ.
(2) C පමණක් සත්‍ය වේ.
(3) A සහ C පමණක් සත්‍ය වේ.
(4) B සහ C පමණක් සත්‍ය වේ.
(5) A, B සහ C සියල්ල ම සත්‍ය වේ.

43. ලෝහයකින් තනන ලද අභ්‍යන්තර අරය R වූ කේශික නළයක් තුළ ජලයේ කේශාකර්ෂණ උස, අභ්‍යන්තර අරය r වූ වීදුරු කේශික නළයකින් ලබා දෙන උස ම බව සොයා ගන්නා ලදී. ජලය සහ වීදුරු අතර ස්පර්ශ කෝණය ශූන්‍ය වේ නම් ලෝහය සහ ජලය අතර ස්පර්ශ කෝණය

(1) ශූන්‍යය (2) $\cos^{-1}\left(\frac{r}{R}\right)$ (3) $\cos^{-1}\left(\frac{R}{r}\right)$ (4) $\cos^{-1}\left(\frac{r}{2R}\right)$ (5) $\cos^{-1}\left(\frac{2R}{r}\right)$

44. ප්‍රත්‍යාවර්ත ධාරා ජනකයකින් සහ පූර්ණ තරංග සෘජුකාරකයකින් යුත් විද්‍යුත් සැපයුමක සුමට නොකළ ප්‍රතිදානයෙහි වෝල්ටීයතාව (V) සහ කාලය (t) අතර සම්බන්ධතාව ඉතාමත් හොඳින් නිරූපණය කරනු ලබන්නේ,



45. සමාන වි.ගා.බ. අගයන් සහිතව ද, එහෙත් එකක අභ්‍යන්තර ප්‍රතිරෝධය ශූන්‍ය සහ අනෙකෙහි අභ්‍යන්තර ප්‍රතිරෝධය පරිමිත අගයක් සහිතව ද වන කෝෂ දෙකක් සඳහා කර ඇති පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න.

(A) අග්‍රයන් ලුහුවත් කළ විට කෝෂ දෙක ම අපරිමිත ධාරා ඇති කරයි.
(B) සර්වසම ප්‍රතිරෝධ හරහා සම්බන්ධ කළ විට මෙම කෝෂ දෙකෙහි ම අග්‍ර අතර විභව අන්තර එක සමාන වේ.
(C) විශාල ධාරාවක් ලබා ගත් විට කෝෂ දෙකින් එකක් රත්වීමට භාජනය වේ.

ඉහත සඳහන් ප්‍රකාශ අතරින්
(1) A පමණක් සත්‍ය වේ.
(2) C පමණක් සත්‍ය වේ.
(3) B සහ C පමණක් සත්‍ය වේ.
(4) A සහ C පමණක් සත්‍ය වේ.
(5) A, B සහ C සියල්ල ම සත්‍ය වේ.

46. රූපයේ දක්වෙන පරිපථය සඳහා ඇමීටරයේ පාඨාංකය ශූන්‍ය කළ විට වෝල්ටමීටරයේ පාඨාංකය 2 V වේ. වෝල්ටමීටරයේ පාඨාංකය ශූන්‍ය කළ විට (කුඩා කාලයකට) ඇමීටරයේ පාඨාංකය 1 A වේ. ඇමීටරයේ ප්‍රතිරෝධය නොගිණිය හැකි නම් කෝෂයේ අභ්‍යන්තර ප්‍රතිරෝධය වනුයේ



(1) 0 (2) 0·5 Ω (3) 1 Ω
(4) 2 Ω (5) 3 Ω

47. ඒකලිත කර ඇති 1μF, 2μF සහ 3μF ධාරිතාවන් සහිත වූ ධාරිත්‍රක තුනක් රූපයේ පෙන්වා ඇති පරිදි පිළිවෙළින් 2 μC, 6 μC සහ 6 μC ආරෝපණ ප්‍රමාණ රඳවා ගෙන සිටී. ධාරිත්‍රකවල ධන තහඩු එකට සම්බන්ධ කළහොත් එම ධන තහඩුවලට සාපේක්ෂ ව A, B සහ C තහඩු අග්‍ර මත විභවයන් පිළිවෙළින් (වෝල්ට්වලින්) වන්නේ



(1) $-2, -3, -2$
(2) $2, 3, 2$
(3) $\frac{7}{3}, \frac{7}{3}, \frac{7}{3}$
(4) $-\frac{7}{3}, -\frac{7}{3}, -\frac{7}{3}$
(5) $\frac{77}{3}, \frac{77}{3}, \frac{77}{3}$

[අනෙක් පිට බලන්න.

48. රූපයේ පෙන්වා ඇති නියත ධාරාවක් රැගෙන යන කෙටි පරිනාලිකාවක අක්ෂය ඔස්සේ චුම්බක ප්‍රාව ඝනත්වයේ (B) විචලනය වඩාත් ම හොඳින් නිරූපණය වන්නේ





(1) (2) (3) (4) (5)

49. රූපයේ පෙන්වා ඇති පුඩුව I ධාරාවක් රැගෙන යයි. O හි චුම්බක ප්‍රාව ඝනත්වය වන්නේ



(1) $\frac{\mu_0 I}{8}\left(\frac{3}{R_1}+\frac{1}{R_2}\right)$

(2) $\frac{\mu_0 I}{4}\left(\frac{3}{R_1}+\frac{1}{R_2}\right)$

(3) $\frac{\mu_0 I}{8}\left(\frac{1}{R_1}+\frac{1}{R_2}\right)$

(4) $\frac{\mu_0 I}{8(R_1+R_2)}$

(5) $\frac{\mu_0 I}{2}\left(\frac{2}{R_1}+\frac{1}{R_2}\right)$

50. X රූපයේ දක්වෙන පරිදි සමතල තඹ තහඩුවක්, B ඒකාකාර චුම්බක ක්ෂේත්‍රයට ලම්බව තබා ඇත. I ධාරාවක් තහඩුව තුළින් ගමන් කරවනු ලැබේ.
අනවරත අවස්ථාවේ දී,

(1) X සිට Y දක්වා ධාරාවක් ගමන් කරයි.
(2) Y සිට X දක්වා ධාරාවක් ගමන් කරයි.
(3) Y ට සාපේක්ෂව X හි සෘණ විභවයක් හට ගනී.
(4) Y ට සාපේක්ෂව X හි ධන විභවයක් හට ගනී.
(5) X සහ Y අතර ධාරාවක් ගැලීමක් හෝ විභව අන්තරයක් ඇතිවීමක් සිදු නොවේ.



51. රූපයේ දක්වා ඇති විස්ථාපන (s) – කාල (t) ප්‍රස්තාරයට අනුකූල වන ප්‍රවේග (v) – කාල (t) ප්‍රස්තාරය වඩාත් ම හොඳින් නිරූපණය වන්නේ පහත සඳහන් වක්‍රවලින් කුමන වක්‍රයෙන් ද?





(1)



(2)



(3)



(4)



(5)

52. එක්තරා ජල ප්‍රමාණයක් සහිත ලෝහ බඳුනක් ඒකාකාර ව නියත ශීඝ්‍රතාවකින් රත් කරනු ලැබේ. පරිසරයට හානි වන තාපය නොසලකා හැරිය හැකි නම්, භාජනය මගින් තාපය උරා ගන්නා ශීඝ්‍රතාව (R) කාලය (t) සමග ප්‍රස්තාර ගත කළ විට එය වඩාත් හොඳින් නිරූපණය විය හැක්කේ



(1) (2) (3) (4) (5)

53. හොඳින් අවුරා ඇති $APQB$ නම් ඒකාකාර දණ්ඩක දෙකෙළවර රූපයේ පෙන්වා ඇති පරිදි 100 °C සහ 0 °C හි පවත්වා ගෙන යනු ලැබේ. දණ්ඩෙහි PQ කොටස වෙනත් ද්‍රව්‍යයකින් සාදා ඇති අතර එම කොටසෙහි තාප සන්නායකතාව දණ්ඩෙහි ඉතිරි ද්‍රව්‍යයේ තාප සන්නායකතාවට වඩා අඩු ය. දණ්ඩ අනවරත අවස්ථාවට පත් වූ පසු පහත දක්වා ඇති ප්‍රස්තාර අතරින් කුමන ප්‍රස්තාරය, දණ්ඩ දිගේ උෂ්ණත්වය (θ) වෙනස් වීම වඩාත් හොඳින් දක්වයි ද?





(1) (2) (3) (4) (5)

54. රූපයේ පෙන්වා ඇති විභවමාන පරිපථයේ P කෝෂයේ වි.ගා.බ. E_P ද අභ්‍යන්තර ප්‍රතිරෝධය r_P ද වන අතර Q කෝෂයේ වි.ගා.බ. E_Q ද අභ්‍යන්තර ප්‍රතිරෝධය r_Q ද වේ. මෙම සැකැස්මේ දී සංතුලන ලක්ෂ්‍යයක් ලබා ගැනීමට නොහැකි වීම සඳහා, දී ඇති පහත සඳහන් හේතු සලකා බලන්න.



(A) $E_P > E_Q$ සහ $r_P = 0,\ r_Q > 0$.

(B) $E_P < E_Q$ සහ $r_P > 0,\ r_Q = 0$.

(C) $E_P = E_Q$ සහ $r_P > 0,\ r_Q > 0$.

ඉහත හේතු අතරින් සත්‍ය වන්නේ

(1) A පමණි.
(2) B පමණි.
(3) C පමණි.
(4) B සහ C පමණි.
(5) A, B සහ C සියල්ලම.

55. ශිෂ්‍යයෙක් තුනී කඩදාසි තීරුවක් තම යටි තොලට පහළින් තබා එය මතින් තිරස් අතට වාතය පිඹියි. කඩදාසි තීරුවේ එක් පැත්තක වර්ගඵලය A ද, එහි ස්කන්ධය m ද නම් කඩදාසිය තිරස් පිහිටුමක රඳා ගැනීම සඳහා වාතය පිඹිය යුතු වේගය υ (වාතයේ ඝනත්වය $= \rho$)

(1) $\upsilon = \left(\frac{2mg}{\rho A}\right)^{\frac{1}{2}}$ (2) $\upsilon = \left(\frac{mg}{\rho A}\right)^{\frac{1}{2}}$ (3) $\upsilon = \left(\frac{mg}{2\rho A}\right)^{\frac{1}{2}}$

(4) $\upsilon = \left(\frac{3mg}{\rho A}\right)^{\frac{1}{2}}$ (5) $\upsilon = \left(\frac{mg}{3\rho A}\right)^{\frac{1}{2}}$

56. සමාන I ධාරාවන් රැගෙන යන AB හා CD යන සෘජු කම්බි දෙකක් රූපයේ පෙන්වා ඇති පරිදි එකිනෙකට සමමිතිකව හා ලම්බ ව තබා ඇත. AB අනන්ත දිගකින් යුක්ත වන අතර CD ට පරිමිත දිගක් ඇත. AB මගින් CD මත ඇති කරනු ලබන චුම්බක ඵලය බවත්



(1) සම්ප්‍රයුක්ත බලයක් හා දක්ෂිණාවර්ත බල යුග්මයක් සාදයි.
(2) සම්ප්‍රයුක්ත බලයක් හා වාමාවර්ත බල යුග්මයක් සාදයි.
(3) ශූන්‍ය සම්ප්‍රයුක්ත බලයක් හා දක්ෂිණාවර්ත බල යුග්මයක් සාදයි.
(4) ශූන්‍ය සම්ප්‍රයුක්ත බලයක් හා වාමාවර්ත බල යුග්මයක් සාදයි.
(5) ශූන්‍ය සම්ප්‍රයුක්ත බලයක් හා ශූන්‍ය බල යුග්මයක් සාදයි.

57. පහත සඳහන් I - V වක්‍ර අතරින් කුමක් සූත්‍රිකා විදුලි බල්බයක් සඳහා ගැලපේ ද?



(1) (2) (3) (4) (5)

58. තරංග ආයාමය λ වන සෘජු තරංග පෙරමුණු, පළල d වන බාධකයක් මතට පතනය වේ. $d >> \lambda$ නම්, තරංග පෙරමුණුවල ස්වභාවය වඩාත්ම හොඳින් නිරූපණය වන්නේ කවර රූප සටහන මගින් ද?



(1) (2) (3) (4) (5)

59. ගඟක පතුළෙහි සිටින පුද්ගලයෙක් ගඟෙහි ජල පෘෂ්ඨය හරහා රූපයේ දැක්වා ඇති පරිදි ඉහළට ඇස් යොමු කරයි. ඔහුගේ ඇස් *P* ලක්ෂ්‍යයේ පිහිටා ඇත. ගඟෙහි ජලය නිසල ව පවතින අතර එය තුළින් පැහැදිලි ව පෙනේ. පුද්ගලයා විසින් දකින දර්ශනය වඩාත් හොඳින් නිරූපණය වන්නේ





(1)



(2)



(3)



(4)



(5)

60. ස්කන්ධය නොගිණිය හැකි කුඩා සෘජුකෝණාස්‍රාකාර කම්බි පුඩුවක් V නියත ප්‍රවේගයකින් රූපයේ දක්වෙන පරිදි ඒකාකාර චුම්බක ක්ෂේත්‍රයක් හරහා ගමන් කරවනු ලැබේ. V නියත ප්‍රවේගය පවත්වා ගෙන යාම සඳහා පුඩුව මත යෙදිය යුතු F බාහිර බලය කාලය t සමග වෙනස් වෙන ආකාරය වඩාත් හොඳින් නිරූපණය වන්නේ





(1)



(2)



(3)



(4)



(5)

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

15315

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 1997 අගෝස්තු (නව නිර්දේශය)
கல்விப் பொதுத் தராதரப்பத்திர(உயர் தர)ப் பரீட்சை, 1997 ஓகஸ்ற் (புதிய பாடத்திட்டம்)
General Certificate of Education (Adv. Level) Examination, August 1997 (*New Syllabus*)

භෞතික විද්‍යාව II
பௌதிகவியல் II
Physics II

01	
S	II

පැ තුනයි / மூன்று மணி / *Three hours*

වැදගත් : මෙම ප්‍රශ්න පත්‍රය කඩදාසි දෙකකින් සමන්විත ය.
ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නො ලැබේ.

විභාග අංකය :..............................

මේ ප්‍රශ්න පත්‍රයට **A, B** යනුවෙන් කොටස් **දෙකක්** ඇත. කොටස් දෙකට ම නියමිත කාලය පැ **තුනයි**.
ප්‍රශ්න හතරක් ඇති **A** කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු යි. මේ කොටසෙහි ප්‍රශ්නවලට පිළිතුරු ප්‍රශ්න පත්‍රයේ ඉඩ සලසා ඇති තැන්වල ලිවිය යුතු යි.
B කොටස ප්‍රශ්න අටකින් යුක්ත වේ. පිළිතුරු සැපයිය යුත්තේ ඉන් ප්‍රශ්න හතරකට පමණි; මේ පිළිතුරු, සපයනු ලබන කඩදාසිවල ලිවිය යුතු වේ.
සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය අවසන් වූ පසු, **A, B** කොටස් දෙක එක් උත්තර පත්‍රයක් වන සේ **A** කොටස උඩින් තිබෙන පරිදි අමුණා ශාලාධිපතිට භාර දිය යුතු වේ.

A කොටස - ව්‍යුහගත රචනා

ප්‍රශ්න හතරට ම පිළිතුරු සපයන්න.

මෙම තීරයේ කිසිවක් නො ලියන්න.

$(g = 10 \text{ N kg}^{-1})$

1.



ස්කන්ධය M සහ අරය R වූ වෘත්තාකාර හැඩයකින් යුත් ඒකාකාර A තැටියක් සුමට මේසයක් මත තිරස් ව සවි කර ඇත්තේ, එහි O කේන්ද්‍රය හරහා ගමන් කරන සිරස් සුමට අක්ෂ දණ්ඩක් වටා නිදහසේ භ්‍රමණය වීමට හැකි වන ආකාරයට ය. තැටියෙහි පරිධිය වටා කිහිප වරක් හදට ඔතා ඇති සැහැල්ලු තන්තුවක්, සැහැල්ලු P කප්පියක් ද වටා ගොස් එහි නිදහස් කෙළවර මගින් රූපයේ පෙනෙන පරිදි m ස්කන්ධයකින් යුත් B භාරයක් දරා සිටී. භ්‍රමණ අක්ෂය වටා තැටියේ අවස්ථිති ඝූර්ණය, $I = \frac{1}{2}MR^2$ වේ. තන්තුව ඇදී සිටින පරිදි පද්ධතිය නිශ්චල ව තබා කාලය $t = 0$ දී මුදා හරිනු ලැබේ.

(*a*) A සහ B මගින් ඇති කරනු ලබන්නේ කුමන ආකාරයේ චලිත ද?

A; ....

B; ....

මෙම තීරයේ කිසිවක් නො ලියන්න.

(b) (i) *A* තැටියේ කෝණික ත්වරණය α ද, *B* භාරයේ ත්වරණය a ද නම්, α සහ a අතර සම්බන්ධය ලියා දක්වන්න.

....

(ii) තැටිය මත ක්‍රියා කරන ව්‍යාවර්තය Γ සහ α අතර සම්බන්ධතාව කුමක් ද?

Γ = ...

(c) කුඩා කාලයකට පසු ව හදිසියේ ම තන්තුව කැඩුනේ නම් *A* සහ *B* හි චලිතයට කුමක් සිදු වේද?

A; ....

B; ....

(d) ඉහත *(c)* හි දක්වූ ආකාරයට තන්තුව කැඩුනු පසු *A* තැටිය මතට, සමාන අරයකින් ද එහෙත් ස්කන්ධය $\frac{M}{2}$ ද වූ නිශ්චලව ඇති දෙවන තැටියක් සමමිතික ව අත හරිනු ලැබේ. තැටි දෙක ම එකට ඇලී භ්‍රමණය වන බව පෙනිණ.

(i) තැටිවල නව කෝණික ප්‍රවේගය සොයා ගැනීම සඳහා ඔබ භාවිත කරන මූලධර්මය කුමක් ද?

....

(ii) එම මූලධර්මය සත්‍ය වන්නේ කුමන තත්ත්වය යටතේ ද?

....

(iii) දෙවන තැටිය අත හැරීමට පෙර *A* තැටියෙහි කෝණික ප්‍රවේගය ω_0 නම්, තැටිවල නව කෝණික ප්‍රවේගයෙහි අගය ω_0 පදය උපයෝගී කර ගනිමින් සොයන්න.

....

....

....

(e) ඉහත *(c)* හි දක්වූ ආකාරයට තන්තුව නොකැඩී ඒ වෙනුවට අක්ෂ දණ්ඩ කැඩී යාමෙන් තැටියට නිදහසේ චලනය වීමට ඉඩ ලැබුනේ යැයි සිතන්න.

(i) *A* කුමන අන්දමේ චලිතයක් ඇති කරයි ද?

....

(ii) *A* හි කෝණික ත්වරණය *b* (i) හි අගයට ම සමාන ව පවතී ද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

....

....

2. සිසිලන ක්‍රමය භාවිතයෙන් ද්‍රවයක විශිෂ්ට තාප ධාරිතාව නිර්ණය කළ හැකි පරීක්ෂණ සැකැස්මක් රූපයේ දක්වේ.



(a) *A* භාජනය හඳුන්වන්න.

....

(b) මෙම පරීක්ෂණය සඳහා අත්‍යාවශ්‍ය අමතර මිනුම් උපකරණ මොනවා ද?

....

....

මෙම තීරයේ කිසිවක් නො ලියන්න.

(c) පරිසරයට තාපය හානි වීමේ ශීඝ්‍රතාව රඳා පවතින්නේ *A* භාජනයේ කුමන භෞතික සාධක මත ද?

1. ....

2. ....

3. ....

(d) මෙම පරීක්ෂණයේ දී ජලය සහ ද්‍රවය සඳහා සිසිලන වක්‍ර වෙන වෙන ම ලබා ගනු ලැබේ.

(i) භාවිත කරන ජල ප්‍රමාණයට අනුරූප ව කෙතරම් ද්‍රව ප්‍රමාණයක් භාවිත කළ යුතු ද?

....

(ii) ඔබේ ඉහත *(d)* (i) හි පිළිතුර සඳහා හේතුව දෙන්න.

....

....

(e) ජලයේ තාප ධාරිතාව භාවිත කළ ද්‍රවයේ තාප ධාරිතාවට වඩා විශාල බව උපකල්පනය කරමින් මෙම පරීක්ෂණයේ දී ඔබට ලැබෙන සිසිලන වක්‍ර දෙකෙහි දළ සටහන් අඳින්න. වක්‍ර පැහැදිලි ව නම් කරන්න.

(f) ද්‍රවයේ විශිෂ්ට තාප ධාරිතාව නිර්ණය කිරීම සඳහා වක්‍ර දෙකෙන් රාශීන් දෙකක් ලබා ගත යුතු ව ඇත. මෙම රාශීන් ලබා ගැනීම සඳහා අවශ්‍ය වන නිර්මාණ *(e)* හි රූපයේ ඇඳ දක්වන්න.

(g) මන්ථය සමග *A* හි තාප ධාරිතාව *W* ද, ජලයේ සහ ද්‍රවයේ ස්කන්ධ පිළිවෙළින් m_W සහ m_l ද, ජලයේ සහ ද්‍රවයේ විශිෂ්ට තාප ධාරිතා පිළිවෙළින් s_W සහ s_l ද නම් මේවා *(f)* හි සඳහන් රාශීන්ට දක්වන සම්බන්ධතාව සඳහා ප්‍රකාශනයක් ලියන්න.

....

....

....

(h) **A** භාජනය සහ බාහිර භාජනය අතර අවකාශය ජලයෙන් පුරවා මෙම පරීක්ෂණය නිවැරදි ව සිදු කළ හැකි ද? ඔබේ පිළිතුර පහදා දෙන්න.

....

....

මෙම තීරයේ කිසිවක් නො ලියන්න.

3. විතතිමාන කම්බියක් 1·0 m පරතරයකින් යුත් A සහ B ලක්ෂ්‍ය දෙක අතර රූපයේ පෙන්වා ඇති අයුරු ඇද ඇත. කම්බියේ මැද (O) පෙලීමෙන් එක් පුඩුවක් සහිත ව තීර්යක් ලෙස කම්බිය කම්පනය වීමට සලස්වනු ලැබේ.

15315



කම්බිය සිරස් තලයක සරල අනුවර්තීය ආකාරයෙන් කම්පනය වන අතර එහි චලිතය $a = -16\pi^2 \times 10^4 y$ මගින් දෙනු ලැබේ. මෙහි a යනු ත්වරණය ($m\,s^{-2}$), වන අතර y යනු සිරස් විස්ථාපනය වේ.

(a) (i) කාලය t සමග y හි විචලනය පෙන්වීමට දළ වක්‍රයක් අඳින්න.

(ii) කම්බියේ කම්පනයෙහි ආවර්ත කාලය සොයන්න.

....

....

(iii) කම්පනයේ සංඛ්‍යාතය ද සොයන්න.

....Hz

(b) (i) සැදෙන තරංගයේ තරංග ආයාමය කොපමණ ද?

....

(ii) එනයින් කම්බියේ ඇති වන තීර්යක් තරංගයේ ප්‍රවේගය ගණනය කරන්න.

....

....

(c) (i) කම්බියේ තීර්යක් තරංග ප්‍රවේගය (V) ආතතිය (T) සහ ඒකක දිගක ස්කන්ධය (m) සම්බන්ධ කරන ප්‍රකාශනය ලියා දක්වන්න.

....

(ii) $m = 1{\cdot}0 \times 10^{-4}\ kg\,m^{-1}$ නම් කම්බියේ ආතතිය කුමක් ද?

....

....

මෙම තීරයේ කිසිවක් නො ලියන්

(d) (i) කම්පනය කරන ලද සරසුලක් භාවිත කොට ධ්වනිමාන කම්බිය අනුනාද කරන ලෙස සිසුන්ට නියම කළ විට ඔවුන් විසින් පහත සඳහන් ක්‍රම භාවිත කරන ලදී.

(1) කම්බියේ මැදට ඉහළින් සරසුල අල්ලා ගෙන සිටීම.

(2) කම්බියේ මැද සරසුල තැබීම.

(3) ධ්වනිමාන පෙට්ටිය මත සරසුල තැබීම.

ඉහත ක්‍රමවලින් කුමක් නිරවද්‍ය ද?

ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

....

....

(ii) කම්බිය සමග අනුනාද වීම සඳහා සරසුලට තිබිය යුතු අඩු ම සංඛ්‍යාතය කුමක් ද?

....

(e) කඩදාසි ආරෝහකයක් කම්බියේ මැද තබා ඇත්නම්, O ලක්ෂ්‍යයෙහි විස්ථාපනයේ කුමන අවම අගයක් ඇති විට කඩදාසි ආරෝහකය කම්බියෙන් ඉවතට පනින්නට පෙළඹෙයි ද? (ඉඟිය : මෙය සිදුවන්නේ කම්බියෙන් කඩදාසි ආරෝහකය මත පවතින ප්‍රතික්‍රියාව ශුන්‍ය වන විටය.)

....

....

....

4. (a) සළ දහර ගැල්වනෝමීටරයක් තුළින් I ධාරාවක් යවනු ලැබේ. I ධාරාව සමග ගැල්වනෝමීටර උත්ක්‍රමය θ වෙනස් වන්නේ කෙසේ දැයි පෙන්වීමට දළ වක්‍රයක් අඳින්න.



සළ දහර ගැල්වනෝමීටරයක් හරහා 1 mA ධාරාවක් යැවූ විට පූර්ණ පරිමා උත්ක්‍රමයක් ලබා දේ. ගැල්වනෝමීටරයේ අභ්‍යන්තර ප්‍රතිරෝධය 50 Ω වේ.

(b) මෙම ගැල්වනෝමීටරය වෝල්ට්මීටරයක් ලෙස ක්‍රමාංකනය කර ඇති නම් එය මඟින් මිනිය හැකි උපරිම විභව අන්තරය කුමක් ද?

....

(c) (i) ඉහත සඳහන් කළ ගැල්වනෝමීටරය පූර්ණ පරිමා උත්ක්‍රමය 1 V වන වෝල්ට්මීටරයක් බවට පරිවර්තනය කිරීමට අවශ්‍ය නම් ඔබ එය සපුරා ගන්නා අන්දම රූපයක ආධාරයෙන් පෙන්වන්න. (උපාංග සම්මත සංකේත මගින් පැහැදිලි ව දක්වන්න.)

(ii) අවශ්‍ය ප්‍රතිරෝධයේ අගය ගණනය කරන්න.

....

....

මෙම තීරයේ කිසිවක් නො ලියන්න.

(d) (i) ඉහත (*c*) හි සඳහන් කළ වෝල්ට්මීටරය, පෙන්වා ඇති පරිපථයෙහි *XY* හරහා සම්බන්ධ කළහොත් මීටරයේ පාඨාංකය කුමක් වේ ද? (කෝෂයේ අභ්‍යන්තර ප්‍රතිරෝධය නොසලකා හරින්න.)



....

....

....

(ii) 1000 Ω හරහා නියම විභව අන්තරය වෝල්ට්මීටරය මගින් කියවේ ද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

....

....

(e) *XY* හරහා *V* වෝල්ටීයතාව මැනීම සඳහා වෙනස් *r* අභ්‍යන්තර ප්‍රතිරෝධ අගයන්ගෙන් යුත් තවත් වෝල්ට්මීටර ගණනාවක් ම ඔබට සපයා ඇතැයි සිතන්න. *r* ට ඉදිරියෙන් *V* ප්‍රස්තාර ගත කළහොත් ඔබ බලාපොරොත්තු වන වක්‍රයේ දළ සටහනක් අඳින්න.



(f) පූර්ණ පරිමා උත්ක්‍රමය 1 V සහ අභ්‍යන්තර ප්‍රතිරෝධය 10 000 Ω වූ වෝල්ට්මීටරයක් සෑදීමට ඔබට අවශ්‍යව ඇතැයි සිතන්න. මෙම කාර්යය සඳහා අවශ්‍ය වන සළ දඟර ගැල්වනෝමීටරයක පූර්ණ පරිමා උත්ක්‍රම ධාරාව කුමක් ද?

....

(g) ඉහත (*f*) හි සඳහන් කළ වෝල්ට්මීටරයේ අභ්‍යන්තර ප්‍රතිරෝධය, 10 MΩ ප්‍රමාණයේ ඉතා විශාල අගයකට වැඩි කිරීම ප්‍රායෝගික ව අපහසු වන්නේ ඇයි දැයි දැක්වීමට එක් හේතුවක් දෙන්න.

....

....

[සියලු ම හිමිකම් ඇවිරිණි]
(முழுப் பதிப்புரிமையுடையது)
All F ghts Reserved]

15315

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 1997 අගෝස්තු *(නව නිර්දේශය)* கல்விப் பொதுத் தராதரப்பத்திர(உயர் தர)ப் பரீட்சை, 1997 ஓகஸ்ற் *(புதிய பாடத்திட்டம்)* General Certificate of Education (Adv. Level) Examination, August 1997 ***(New Syllabus)***
භෞතික විද්‍යාව II **பௌதிகவியல் II** **Physics II** — 01 / S / II

B කොටස - රචනා

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

$(g = 10\ \mathrm{N\ kg^{-1}})$

1.



100 m දිවීමේ තරගයකට සහභාගි වන 70 kg කෙටි දුර ධාවකයෙක් B ආරම්භක කුට්ටි මතට 0·2 s කාලයක් තුළ තල්ලුවක් දී $5\ \mathrm{m\ s^{-1}}$ වේගයක් සහිත ව ඉන් නිකුත් වෙයි. ඉන්පසු ඔහු තවත් 5 s කාලයක් ඒකාකාරව ත්වරණය සිදු කර සිය වේගය $12\ \mathrm{m\ s^{-1}}$ ට පත් වූ පසු එම වේගයෙන් ම අවසාන ඉර (finish line) දක්වා දිව යයි.

(i) ආරම්භක කුට්ටි මගින් ධාවකයා මත යොදන ප්‍රතික්‍රියා බලය කොපමණ ද?

(ii) ධාවකයා $12\ \mathrm{m\ s^{-1}}$ උපරිම වේගයට ලඟා වන අවස්ථාව වන විට කොපමණ දුරක් දිව ගොස් ඇත්ද?

(iii) ත්වරණය සිදු කරන කාලය වන 5 s තුළ ධාවකයා විසින් කරන ලද යාන්ත්‍රික කාර්ය ප්‍රමාණය කොපමණ ද?

(iv) තරගය නිම කිරීමට ධාවකයාට ගත වන කාලය සොයන්න.

(v) මෙම තරගයේ දී වෙනත් ධාවකයෙක් ඉහත ආකාරයට 0·2 s සමාන කාලාන්තරය තුළ දී $5{\cdot}4\ \mathrm{m\ s^{-1}}$ ක ආරම්භක වේගයක් ලබා ගැනීම මගින් වඩා හොඳ ආරම්භයක් ලබා ගත්ත ද ඔහුට උපරිම වේගය වන $12\ \mathrm{m\ s^{-1}}$ ට පත්වීම සඳහා 5·4 s කාලයක් ගත කිරීමට සිදු විය. මුල් ධාවකයාට මෙම ධාවකයා පසු කිරීමට ගත වන කාලය සොයන්න. (ඉඟිය: මෙම පසු කිරීම සිදු වන්නේ මුල් ධාවකයාගේ ත්වරණ කාලය තුළ දීය.)

2 **(a)** කොටසට හෝ (b) කොටසට හෝ පමණක් පිළිතුරු සපයන්න.

(a) හිස් බෝට්ටුවක් එහි පරිමාවෙන් 10% ක් දිය යට සිටින සේ ගිලී පාවෙන අතර, එයට 1200 kg ක බරක් පැටවූ විට දියේ ගිලී ඇති පරිමාව මුලු පරිමාවෙන් 70% දක්වා වැඩි වේ.

(i) හිස් බෝට්ටුවේ ස්කන්ධය ගණනය කරන්න.

(ii) 1200 kg බරක් පටවන ලද බෝට්ටුවෙහි කාන්දුවීමක් හට ගැනීම නිසා එය තුළට විනාඩියකට 100 kg නියත (සාමාන්‍ය) ශීඝ්‍රතාවකින් ජලය ඇතුල් වීමට පටන් ගත්තේ නම් කිඳා බැසීමට පෙර එය කොපමණ කාලයක් පා වේ ද?

(iii) දියේ ගිලුන බෝට්ටුව (භාරය රහිත ව) ජල මට්ටම දක්වා එසවීමට අවශ්‍ය අවම බලය කුමක් ද? බෝට්ටුව සාදා ඇති ද්‍රව්‍යයේ මධ්‍යන්‍ය ඝනත්වය $2500\ \mathrm{kg\ m^{-3}}$ වන අතර ජලයේ ඝනත්වය $1000\ \mathrm{kg\ m^{-3}}$ වේ.

(iv) අලුත්වැඩියා කරන ලද බෝට්ටුව වෙනත් 1200 kg භාරයක් පටවා ගෙන යාත්‍රා කරන අතරේ දී හදිසියේ ම කුඩා වායු බුබුලු ඒකාකාරව මිශ්‍ර වී ඇති ජලය සහිත ප්‍රදේශයකට අවතීරණය විය. වායු බුබුලක පරිමාවේ සාමාන්‍ය අගය $1\ \mathrm{mm^3}$ ද වායු බුබුලු සාන්ද්‍රනය $3{\cdot}5 \times 10^8\ \mathrm{m^{-3}}$ ද නම් ජලයේ සඵල ඝනත්වය ගණනය කරන්න. වාතයේ ස්කන්ධය නොසලකා හරින්න. එනයින් බෝට්ටුව ගිලී යන බව පෙන්වන්න.

(v) ඉහත (iv) හි දැක්වූ සංසිද්ධිය යොදා ගනිමින් පහත සඳහන් ක්‍රියාවේ භයානක කම පැහැදිලි කරන්න.

'උස් දිය ඇල්ලක් පාමුල ගැඹුරු ජල තටාකයක් සෑදී ඇත. අයෙක් දිය ඇල්ල පාමුල අසලට පිහිනා යෑම අරඹයි!'

(b) ඩොප්ලර් ආචරණය යන්නෙන් කුමක් අදහස් කරන්නේ දැයි පැහැදිලි කරන්න. මෙම ආචරණය රළිති ටැංකිය මගින් ආදර්ශනය කරන්නේ කෙසේ ද? ඩොප්ලර් ආචරණයේ යෙදීමක් දෙන්න.

බෝට්ටුවක් එහි නලාව 335 Hz සංඛ්‍යාතයකින් යුතු ව නාද කරමින් පැයට කිලෝමීටර 18 වේගයකින් කුඩා කඳු ශිඛරයක් දෙසට ගමන් කරයි. වාතය තුළ ධ්වනි වේගය 340 m s^{-1} වේ.

(i) කඳු ශිඛරය මත සිටින ළමයෙකුට ඇසෙන නලාවේ ශබ්දයෙහි සංඛ්‍යාතය සොයන්න.

(ii) බෝට්ටුව තුළ සිටින මිනිසෙකුට කඳු ශිඛරය නිසා නලා හඬෙහි ඇසෙන දෝංකාරයේ සංඛ්‍යාතය සොයන්න.

(iii) මිනිසාට දෝංකාරයත් නලාවෙන් නිකුත් වන ශබ්දයත් එක වර ඇසේ නම් ඔහුට තත්පරයකට ඇසිය හැකි නුගැසුම් ප්‍රමාණය කොපමණ ද?

(iv) දැන් බෝට්ටුව ආපසු හැරී එම වේගයෙන් ම කඳු ශිඛරයෙන් ඉවතට ගමන් කරයි නම් මිනිසාට ඇසෙන දෝංකාරයේ සංඛ්‍යාතය කුමක් ද?

3. ආලෝක කිරණක් පූර්ණ අභ්‍යන්තර පරාවර්තනයකට බඳුන් වීම සඳහා සපුරාලිය යුතු අවශ්‍යතා සඳහන් කරන්න.



(1) රූපය

(i) වර්තනාංකය $n_1 = 1{\cdot}52$ වන ප්ලාස්ටික් ද්‍රව්‍යයකින් සාදා ඇති ඝන දිගු සිලින්ඩරාකාර තන්තුවකට (1) රූපයේ පෙන්වා ඇති අයුරින් වාතයේ ගමන් ගන්නා ඒක වර්ණ ආලෝක කිරණක් ඇතුල් වේ. ප්ලාස්ටික් - වාත අතුරු මුහුණත සඳහා අවධි කෝණයේ අගය ගණනය කරන්න. එනයින්, θ පතන කෝණයේ ඕනෑම අගයක් සඳහා කිරණය PQ පෘෂ්ඨයෙන් පූර්ණ අභ්‍යන්තර පරාවර්තනයකට බඳුන් වන බව පෙන්වන්න. $\theta = 0$ අවස්ථාව නොසලකා හරින්න.



(2) රූපය

(ii) දැන් (2) රූපයේ පෙන්වා ඇති පරිදි වර්තනාංකය $n_2 = 1{\cdot}48$ වන වෙනත් ප්ලාස්ටික් ද්‍රව්‍යයකින් ඉහත තන්තුව සම්පූර්ණයෙන් ආවරණය කරනු ලැබේ. PQ මුහුණතෙන් පූර්ණ අභ්‍යන්තර පරාවර්තනයට බඳුන් විය හැකි කිරණක් සඳහා තිබිය හැකි θ කෝණයේ උපරිම අගය නිර්ණය කරන්න.

(iii) $\theta = 80°$ වන සේ පතනය වන ආලෝක කිරණක් වාතයට නිර්ගමනය නොවන බව පෙන්වන්න.

4. **(a) කොටසට හෝ (b) කොටසට පමණක් පිළිතුරු සපයන්න.**

(a)



A පරීක්ෂා නළයක් සහ B පටු නළයක් 0 °C හි ජලය පුරවා ඇති භාජනයකට සවි කර ඇත. භාජනයේ **බිත්ති ඒකාකාර** ඝනකමකින් යුත් දුර්වල සන්නායක ද්‍රව්‍යයකින් සාද ඇත. C යනු එම ද්‍රව්‍යයෙන් ම සාදන ලද, **පරීක්ෂා නළයෙහි** පියන වේ. 0 °C පවතින ඊතර් 10^{-2} kg ප්‍රමාණයක් පරීක්ෂා නළය තුළට දමා එය තුළින් වාතය බුබුලනය කිරීම මගින් ඉක්මනින් වාෂ්ප වී යෑමට සලස්වන ලදී.

(i) ඊතර් වාෂ්පීභවනය වීමත් සමග පරීක්ෂා නළයේ පිට පෘෂ්ඨය මත කුමන වෙනසක් දකිය හැකි ද?

(ii) B නලයේ හරස්කඩ ක්ෂේත්‍රඵලය $10^{-5}\,\mathrm{m^2}$ නම් ඊතර් වාෂ්පීභවනය වීම නිසා B හි ජල මට්ටමේ ඇති වන වෙනස ගණනය කරන්න.

0 °C හි දී ජලයේ ඝනත්වය = $1000\,\mathrm{kg\,m^{-3}}$

0 °C හිදී අයිස්හි ඝනත්වය = $920\,\mathrm{kg\,m^{-3}}$

0 °C හි දී ඊතර්වල වාෂ්පීභවනයේ විශිෂ්ට ගුප්ත තාපය = $3{\cdot}84 \times 10^5\,\mathrm{J\,kg^{-1}}$

0 °C හි දී අයිස්හි විලයනයේ විශිෂ්ට ගුප්ත තාපය = $3{\cdot}36 \times 10^5\,\mathrm{J\,kg^{-1}}$

(iii) ඊතර් වාෂ්පීභවනය වීම අවසාන වීමෙන් පසු උපකරණය කාමර උෂ්ණත්වය 30 °C වූ කාමරයක් තුළ තිබීමට ඉඩ හැරිය විට B හි ජල මට්ටම තත්පරයකට 1 mm ශීඝ්‍රතාවකින් සෙමෙන් වෙනස් වීමට පටන් ගනී. භාජනයේ බිත්තියෙහි ඝනකම 2×10^{-2} m ද එහි සඵල වර්ගඵලය $0{\cdot}4\,\mathrm{m^2}$ ද නම් බිත්තිය සාද ඇති ද්‍රව්‍යයේ තාප සන්නායකතාව ගණනය කරන්න. ජලයේ උෂ්ණත්වය 0 °C අගයේ පවතින්නේ යයි උපකල්පනය කරන්න.

(b) $PV = \frac{1}{3} nm \overline{c^2}$ ප්‍රකාශනයේ සංකේත හඳුන්වන්න.

ඉහත ප්‍රකාශනය සහ පරිපූර්ණ වායු සමීකරණය භාවිත කර, T උෂ්ණත්වයේ දී පරිපූර්ණ වායු අණුවක චාලක ශක්තියෙහි සාමාන්‍ය අගය $\frac{3}{2} kT$ ලෙස ලිවිය හැකි බව පෙන්වන්න. මෙහි $k = \frac{R}{N_A}$ වන අතර, R සර්වත්‍ර වායු නියතය ද N_A ඇවගාඩ්රෝ අංකය ද වේ.

(i) 27 °C හි දී මෝටර් වාහන ටයරයක් තුළ පීඩනය 250 kPa බව සොයා ගන්නා ලදී. පීඩනය 300 kPa දක්වා වැඩි කිරීම සඳහා, 27 °C සහ පීඩනය 500 kPa හි පවතින සම්පීඩිත වාතය කවර පරිමාවක් මෙම ටයරය තුළට පොම්ප කළ යුතු ද? ටයරයේ පරිමාව $0{\cdot}05\,\mathrm{m^3}$ අගයෙහි නියත ව පවතින බවත් ටයරය තුළ උෂ්ණත්වය 27 °C හි ම පවතින බවත් උපකල්පනය කරන්න.

(ii) මෝටර් රථය අධික වේගයෙන් ධාවනය කිරීම හේතු කොට ගෙන ටයරය තුළ උෂ්ණත්වය 57 °C දක්වා වැඩි විය. ටයරය තුළ ආරම්භක පීඩනය 300 kPa ද ටයරය ප්‍රසාරණය වීම නිසා එහි පරිමාව 5% ප්‍රමාණයකින් වැඩි වූයේ ද නම්, ටයරය තුළ නව පීඩනය සොයන්න.

$R = 8{\cdot}3\,\mathrm{J\,K^{-1}mol^{-1}}$

(iii) 57 °C හිදී වාත අණු සඳහා වර්ග මධ්‍යන්‍ය මූල වේගය සොයන්න.

$N_A = 6{\cdot}02 \times 10^{23}\,\mathrm{mol^{-1}}$

වාතයේ සාපේක්ෂ අණුක ස්කන්ධයේ මධ්‍යන්‍ය අගය = 27

ටයරය තුළ ඇති සෑම වායු අණුවක්ම ඉහත ගණනය කළ වේගයෙන් ම ගමන් කරයි ද?

ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

[අනෙක් පිට බලන්න.

15315

5. බයෝ-සවා නියමය ප්‍රකාශනයක ආකාරයෙන් දක්වා භාවිත කරන ලද සංකේත හඳුන්වන්න
I ධාරාවක් රැගෙන යන දිග සෘජු කම්බියක සිට r දුරකින් පිහිටි ලක්ෂ්‍යයක චුම්බක ස්‍රාව ඝනත්වය B සඳහා ප්‍රකාශනයක් ලියන්න.



ab යනු මේසයක් මත තබා ඇති දිග සෘජු කම්බියකි. *cd* කම්බිය *ab* ට සමාන්තර ව එයට සිරස් ව ඉහළින් 3×10^{-2} m දුරකින් පිහිටන සේ රූපයේ පෙනෙන පරිදි තබා ඇත. *PQ* යනු *ab* ට සමාන්තරව මේසය මත තබා ඇති ධාරාවක් රැගෙන යන කුඩා සන්නායකයකි. *ab* සහ *PQ* අතර දුර 4×10^{-2} m වේ. *PQ* ට සිරස් සන්නායක පීලි දෙකක් මත නිදහසේ චලනය විය හැක.

PQ හි දිග 10^{-1} m වන අතර එය හරහා **P** සිට **Q** දෙසට 10 *A* ධාරාවක් ගලා යයි.

(i) *ab* කම්බිය දිගේ a සිට *b* දෙසට 5 *A* ධාරාවක් ගලා යන්නේ නම්, මෙම ධාරාව නිසා *PQ* මත ක්‍රියා කරන චුම්බක බලයෙහි විශාලත්වය සහ දිශාව සොයන්න. $\left(\frac{\mu_0}{2\pi} = 2\times10^{-7}\ \mathrm{T\,m\,A^{-1}}\right)$

(ii) *ab* හි ධාරාවට අමතරව *cd* ද *d* සිට *c* දෙසට 6·25 *A* ධාරාවක් රැගෙන යන්නේ නම් *cd* හි ධාරාව නිසා *PQ*, මත ඇති කරන බලයේ විශාලත්වය සොයන්න. බලයේ දිශාව රූප සටහනක් ආධාරයෙන් පෙන්වන්න.

(iii) *PQ* සන්නායකයේ ස්කන්ධය 10^{-4} kg නම් *PQ* චලනය වන දිශාව සහ එහි ආරම්භක ත්වරණයේ විශාලත්වය සොයන්න.

(iv) *PQ*, පීලි මගින් උඩට එසවීමට *cd* තුළ ඇති කළ යුතු අවම ධාරාවේ විශාලත්වය සහ දිශාව සොයන්න.

6. පැත්තක දිග 5·0 cm වන වට 200 කින් සමන්විත $PQRS$ සමචතුරස්‍රාකාර දඟරයක් රූපයේ පෙන්වා ඇති පරිදි ස්‍රාව ඝනත්වය $B = 1{\cdot}2\ T$ වන ඒකාකාර චුම්බක ක්ෂේත්‍රයට ලම්බක ව තබා ඇත. ඉන්පසු දඟරයේ තලය චුම්බක ක්ෂේත්‍රයට ලම්බක ව තබා ගනිමින් එය ඒකාකාර ප්‍රවේගයකින් චුම්බක ක්ෂේත්‍රය ශූන්‍ය පෙදෙසක් වන දකුණු පැත්තට අදිනු ලැබේ. මුළු දඟරයම ක්ෂේත්‍රය නොමැති පෙදෙසට පැමිණීම සඳහා 0·2 s කාලයක් ගත වේ.



(i) 0·2 s කාල අන්තරය තුළ දඟරය මත ප්‍රේරණය වන වි.ගා. බලය ගණනය කරන්න.

(ii) වි.ගා. බලය ප්‍රේරණය වන දඟරයේ පැත්ත/පැති නම් කර ප්‍රේරිත ධාරාවේ දිශාව ඇඳ පෙන්වන්න.

(iii) දඟරයේ ප්‍රතිරෝධය 100 Ω නම් එය තුළ 0·2 s කාල අන්තරය තුළ උත්සර්ජනය වන ශක්තිය ගණනය කරන්න.

(iv) එමගින් ක්ෂේත්‍රයෙන් පිටතට දඟරය ඇදීමට අවශ්‍ය වන කාර්යය ප්‍රමාණය අපෝහනය කරන්න. ඔබේ පිළිතුර ලබා ගැනීම සඳහා භාවිත කළ භෞතික විද්‍යාවේ නියමය සඳහන් කරන්න.

(v) දඟරය පිටතට ඇදීම වෙනුවට, 0·2 s සමාන කාල අන්තරයක් තුළ චුම්බක ක්ෂේත්‍රය ඒකාකාර ව ශූන්‍ය කරා අඩු කළේ නම් (i) හි ලබා ගත් ප්‍රේරිත වි.ගා. බලයේ අගය ම ඔබට ලැබේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

7. (a) කොටසට හෝ (b) කොටසට හෝ පමණක් පිළිතුරු සපයන්න.

(a)



පෙන්වා ඇති පරිපථයේ කෝෂ සහ A_1, A_2 ඇමීටරවලට ඇත්තේ නොගිණිය හැකි තරම් කුඩා අභ්‍යන්තර ප්‍රතිරෝධයන් ය. S යනු ස්විච්චියකි. S වසා ඇති විටකදී A_1 හි නිදහස් අග්‍රය X ලක්ෂයට හෝ Y ලක්ෂයට සම්බන්ධ කළ විට A_1 දක්වන්නේ ශූන්‍ය පාඨාංකයකි.

S විවෘත කර A_1 හි නිදහස් අග්‍රය X ට සම්බන්ධ කළ විට A_2 ඇමීටරය $\frac{5}{12}\ A$ කියවීමක් දක්වයි.

(i) R_3 හි අගය සොයන්න. පිළිතුර ලබා ගැනීමේ දී භාවිත කළ තර්ක පැහැදිලි ව දක්වන්න.
R_1 සහ R_2 අගයයන් ද ගණනය කරන්න.

(ii) S විවෘත කර A_1 හි නිදහස් අග්‍රය X ට සම්බන්ධ කර ඇති විට, R_2 හරහා ගලන ධාරාවෙන් කොටසක් R_3 හරහාත් ගමන් කරයි ද?
ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

(iii) ඉහත (ii) හිදී A_1 ඇමීටරයේ පාඨාංකය කුමක් ද?

(b) පෙන්වා ඇති පරිපථවල D සිලිකන් සන්ධි දියෝඩයකි.



(1) රූපය



(2) රූපය

(i) දියෝඩය පෙර නැඹුරු වී ඇති පරිපථය හඳුන්වා දෙන්න. එම පරිපථයෙහි 10 mA ධාරාවක් ගලන්නේ නම්, උපාංග හරහා විභව බැස්මයන් සැලකිල්ලට ගෙන කෝෂයෙහි වෝල්ටීයතාව සඳහා අගයක් නිමානනය (estimate) කරන්න.

(ii) ඔබට සිලිකන් සෘජුකාරක දියෝඩ හතරක්, C සුමටන ධාරිත්‍රකයක් සහ R_L භාර ප්‍රතිරෝධයක් සපයා ඇත. C සහ R_L ද අඩංගු වන ආකාරයට සේතු සෘජුකාරකයක රූප සටහනක් අඳින්න.

(iii) සෘජුකාරකයෙහි ප්‍රදානය සඳහා යොදනු ලබන V වෝල්ටීයතාව රූප සටහනේ පෙන්වා ඇත. V_P උච්ච වෝල්ටීයතාව 12 V වේ. ප්‍රදානයෙහි A පළමු අර්ධ චක්‍ර කාලය තුළ දී (ii) හි දෙන ලද පරිපථයෙහි ධාරාව ගමන් කරන මාර්ගය ඊතල මගින් පෙන්වන්න.



(iv) C සහ R_L ද අඩංගු වන සෘජුකාරක පරිපථයෙහි ප්‍රතිදාන වෝල්ටීයතා තරංගයෙහි හැඩය අඳින්න. ප්‍රතිදාන වෝල්ටීයතාවෙහි උච්ච අගය ද නිමානනය කරන්න.

(v) යාමනය නොකරන ලද 15 V වෝල්ටීයතාවකින් යාමනය කරන ලද 10 V dc වෝල්ටීයතාවක් ලබා ගැනීම සඳහා පහත සඳහන් පරිපථය දී ඇත.

සෙනර් දියෝඩය හරහා යැවිය හැකි උපරිම ධාරාව 200 mA සහ සෙනර් වෝල්ටීයතාව 10 V නම් R_S සඳහා අවම අගයක් නිමානනය කරන්න.



8. රූපයේ දක්වෙන්නේ පැවතිය හැකි සියලු ප්‍රත්‍යාබල අගයයන් සඳහා යම් ද්‍රව්‍යයක් වෙනුවෙන් ලබා ගත් ප්‍රත්‍යාබල (P) - වික්‍රියාව (S) වක්‍රය යි.



(i) වක්‍රය මත ඇති a සහ b ලක්ෂ්‍ය හඳුන්වන්න.

(ii) ද්‍රව්‍යයේ යං මාපාංකය ගණනය කරන්න. ද්‍රව්‍යය තුළ වික්‍රියාව 2×10^{-3} වන විට එහි ඒකීය පරිමාවක ගබඩා වී ඇති ශක්තිය කොපමණ ද?

(iii) ඉහත සඳහන් ද්‍රව්‍යයෙන් සාදන ලද එක එකෙහි උස 2·5 m වන A ඝන සිලින්ඩරයකින් ද B කුහර සිලින්ඩරයකින් ද සමන්විත සිලින්ඩරාකාර කුලුනක සිරස් හරස්කඩක් රූපයේ දක්වා ඇත. A හි අරය 10 cm වන අතර B හි බාහිර සහ අභ්‍යන්තර අරයයන් පිළිවෙළින් 10 cm සහ 7 cm වේ. (රූපය පරිමාණයට ඇඳ නොමැති බව සලකන්න.)



(a) කුලුන මගින් 1×10^5 N භාරයක් දරා සිටින විට එහි සංකෝචනය කුමක් ද?

(b) මෙම කුලුන නොබිඳී, එයට දැරිය හැකි උපරිම භාරය කුමක් ද?